## I කොටස

* වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඡායා හෙවත් සෙවනැලි ඇතිවීමට හේතුව වන්නේ,

I. ආලෝකය පාරදෘශ්‍ය ද්‍රව්‍ය තුළින් ගමන් කිරීම යි.
II. ආලෝකය පාරභාසක ද්‍රව්‍ය තුළින් ගමන් කිරීම යි.
III. ආලෝකය පාරාන්ධ ද්‍රව්‍ය තුළින් ගමන් නොකිරීම යි.
IV. ආලෝක ප්‍රභවය වස්තුවට ඈතින් පිහිටීම යි.

(02) නිවැරදි ප්‍රකාශය තෝරන්න.

I. සූර්‍ය ග්‍රහණයේදී සූර්යයා හා පෘථිවිය අතරට චන්ද්‍රයා පැමිණේ.
II. චන්ද්‍රග්‍රහණයක් සිදුවීමට සූර්යයා, පෘථිවිය හා චන්ද්‍රයා එකම සරල රේඛාවක තිබිය යුතු නොවේ.
III. චන්ද්‍ර ග්‍රහණයේදී චන්ද්‍රයාගේ සෙවනැල්ල පෘථිවිය මතට වැටේ.
IV. සූර්ය ග්‍රහණයක් සිදුවන්නේ පසළොස්වක පොහොය දිනදී ය.

(03) තල දර්පණ මගින් සෑදෙන ප්‍රතිබිම්භයක ලක්ෂණයක් නොවන්නේ,

I. වස්තුවේ ප්‍රමාණයට සමාන වීම. II. වස්තු දුරට ප්‍රතිබිම්භ දුර සමාන වීම.
III. පාර්ශ්වික අපවර්තනය වීම. IV. තාත්වික වීම.

(04) උත්තල දර්පණයකින් සෑදෙන ප්‍රතිබිම්භ සෑම විටම,

I. වස්තුවේ ප්‍රමාණයට සමාන වේ. II. වස්තුවට වඩා කුඩා වේ.
III. වස්තුවට වඩා විශාල වේ. IV. වස්තුව තබන ස්ථානය අනුව වෙනස් වේ.

(05) තල දර්පණ දෙකක් අතර කෝණය $90^{0}$ ක් වන විට සෑදෙන ප්‍රතිබිම්භ සංඛ්‍යාව,

I. 3 II. 5 III. 7 IV. 11

(06) පියෙවි ඇසෙහි විභේදන බලය වන්නේ,

I. 1 mm II. 2.5 mm III. 0.01 mm IV. 0.1 mm

(07) වැඩිම විභේදන හැකියාවක් ඇත්තේ,

I. සංයුක්ත අන්වීක්ෂයට ය. II. ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයට ය.
III. සරල අන්වීක්ෂයට ය. IV. පියෙවි ඇසට ය.

REVISION PAPERS

CS CamScanner

(08) අන්වීක්ෂීය නිරීක්ෂණයක දී උපනෙතේ x10 ලෙසත් අවනෙතේ x 20 ලෙසත් සටහන් වී තිබුණි. අන්වීක්ෂයේ විශාලනය වන්නේ,

I. 10 II. 20 III. 30 IV. 200

(09) ආලෝක අන්වීක්ෂයක නිදර්ශකය වෙත ලඟාවන ආලෝක ප්‍රමාණය පාලනය කරනුයේ,

I. දළ සිරුමාරුවෙනි. II. ප්‍රාචීරය මගිනි.

III. වේදිකා ක්ලිප මගිනි. IV. අවනෙත මගිනි.

(10) දිගු කලක් භාවිත නොකරන විට අන්වීක්ෂයේ කාච කට්ටල තැබිය යුත්තේ.

I. ඩෙසිකේටරයක් තුළ ය. II. ජලය තුළ ය.

III. පෙට්ටියක් තුළ ය. IV. ඉහත සියල්ලන්ගෙන් ඕනෑම ක්‍රමයකට ය.

* පහත දැක්වෙන එක් එක් අවශ්‍යතාවය සඳහා භාවිත කළ යුතු දර්පණ වර්ගය සඳහන් කරන්න.

(11) පරීක්ෂකයක් සාදා ගැනීම - ..............................

(12) දන්ත වෛද්‍යවරුන්ට රෝගීන්ගේ දත් පරීක්ෂා කිරීම - ..............................

(13) සූර්ය උදුනක් සකස් කර ගැනීමට - ..............................

(14) වාහනයක පැති කණ්ණාඩිය ලෙස - ..............................

(15) මුහුණ බැලීම සඳහා - ..............................

* පහත දැක්වෙන එක් එක් විස්තර සඳහා කෙටි යෙදුමක් බැගින් ලියන්න.

(16) අන්වීක්ෂයෙන් කිසියම් නිදර්ශකයක් විශාල වී පෙනෙන වාර ගණන

..............................

(17) අනුයාත ලක්ෂ දෙකක් පැහැදිලිව වෙන්කර හඳුනා ගැනීමට එම ලක්ෂ දෙක අතර තිබිය යුතු අවම දුර,

..............................

(18) සංයුක්ත අන්වීක්ෂයේ ඇසට ළඟින් පිහිටි කාචය.

..............................

(19) සංයුක්ත අන්වීක්ෂයේ වස්තුවට සමීපව පිහිටි කාචය

..............................

(20) සංයුක්ත අන්වීක්ෂයක අවම විශාලත්වයක් ඇති අවනෙත් කාචය

..............................

I කොටස

1. iii 2. iv 3. iv 4. ii 5. i 6. iv 7. ii 8. iv 9. ii 10. i 11. තල දර්පණ 12. අවතල දර්පණ 13. අවතල දර්පණ 14. උත්තල දර්පණ 15. තල දර්පණ 16. විශාලනය 17. විභේදන බලය 18. උපනෙත 19. අවනෙත 20. අවබල අවනෙත

(ල.2 × 20 =40 )

CamScanner